# Covid-19 සති පාසල (සබරගමුව)

දයාබර දුවේ පුතේ,

Covid – 19 ආපදා තත්ත්වය නිසා ඉස්කෝලේ පටන් ගන්න ගොඩක් කල් ගතවේවි. අපිට ඉතා කෙටි කාලයක් තුල දී ගොඩක් දේවල් ඉගෙන ගන්න වේවි. ඒ හින්දා මේ නිවාඩුවේ අපි ඒ පාඩම්වලට සූදානම් වෙලා ඉස්කෝලේ යමු.

**කාර්යය පත්‍රිකාව**

නර්තනය

9 ශ්‍රේණියේ ii වාරය

පළමුවන සතිය (දියමන්ති ව්‍යාප්තියට අනුව)

පාඩම :- පන් නෙළීමේ හා ගොයම් කැපීමේ නැටුමක් නිර්මාණය කරයි.

නිපුණතාවය :- පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනමින් නර්තන නිර්මාණය කරයි.

---

**• පන් නෙළීමේ හා ගොයම් කැපීමේ නැටුමක් නිර්මාණය සඳහා සූදානම් වෙමු.**

- රූපවාහිනියේ හෝ අන්තර්ජාලයේ හෝ You tube ඇසුරෙන් පන් නෙළීමේ හා ගොයම් කැපීමේ නැටුමක් නරඹන්න.
- එම නැරඹූ නැටුම්වල උපකරණ භාවිතා කරන ආකාරය, රංග රටා නිර්මාණය කල ඇති ආකාරය, කවි ගායනා කරන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න.
- පෙර ශ්‍රේණි වලදී ගැමි නැටුම්වල ලක්ෂණ ලිව්වා වගේ එම පාඩම් ඇසුරු කර ගනිමින් පන් නෙළීමේ හා ගොයම් කැපීමේ නැටුමේ ලක්ෂණ ලියන්න උත්සාහ කරන්න.
- ගොයම් කැපීම සඳහා දැකැත්තකුත් පන් කැපීම සඳහා දැකැත්තකුත් සුදුසු අමුද්‍රවයක් යොදා ගනිමින් නිර්මාණය කරන්න. (අවශ්‍ය නම් වැඩිහිටියෙකුගේ උදව් ගන්න)
- කලින් ශ්‍රේණි වලදී ගැමි නැටුමක් නිර්මාණය කලා වගේ නැරඹූ නැටුම් ඇසරින් කවි 2කට ගොයම් නැටුමක් හා පන් නැටුමක් ඔබට හැකි අයුරින් නිර්මාණය කරන්න උත්සාහ කරන්න.

***

සැකසීම - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලීය සෞන්දර්ය අංශය වෙනුවෙන්

එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
රඹුක මහා විද්‍යාලය
පොතුපිටිය කලවාන